## ජාවාරමට ලක්වූ වින්දිතයන්ට ලද හැකි සේවා

DOL හට ආගමන තත්ත්වය නොසලකා විවිධ සේවාවන් සැපයීමෙන් හෝ ප්‍රජා සංවිධානවලට යොමු කිරීම් මගින් මිනිස් ජාවාරමේ වින්දිතයින්ට උපකාර කිරීමට හැකිය.

ලද හැකි සේවාවන්ට ඇතුළත් වන්නේ:

- හදිසි තාවකාලික නිවාස
- ආහාර සහ අනෙකුත් මූලික අවශ්‍යතා
- නොගෙවූ වැටුප් අයකර ගැනීම
- රැකියා කුසලතා පුහුණුව සහ ස්ථානගත කිරීම
- සංක්‍රමණ සහ නීති ආධාර
- එක්සත් ජනපදයේ ස්ථිර පදිංචිය ස්ථාපිත කිරීමට උදව් වීම
- මානසික හා ශාරීරික සෞඛ්‍ය සේවා
- උපදේශනය
- ෆෙඩරල් සහ ප්‍රාන්ත මහජන ප්‍රතිලාභ ලබා ගැනීමට උපකාර කිරීම
- පරිවර්තනය සහ භාෂණ පරිවර්තනය
- ජාවාරම්කරුට එරෙහිව අපරාධ සහ/හෝ සිවිල් ක්‍රියාමාර්ග ගැනීම



මිනිස් ජාවාරම් පිළිබඳ සැක සහිත සිද්ධීන් වාර්තා කිරීම සඳහා, සම්බන්ධ වන්න:

**නිව්යෝර්ක් රාජ්‍ය කම්කරු දෙපාර්තමේන්තුව අනුකූලතා සහ අධ්‍යාපන කොට්ඨාශය (කලින් සංක්‍රමණික ප්‍රතිපත්ති සහ සබඳතා කොට්ඨාශය ලෙස හැඳින්වූ)**

දුරකථන: 877-466-9757
විද්‍යුත් තැපෑල: trafficking@labor.ny.gov
වෙබ් අඩවිය: www.labor.ny.gov/immigrants

**ජාතික මිනිස් ජාවාරම් සම්පත් මධ්‍යස්ථාන**

දුරකථන: 888-373-7888

**අතිරේක සම්පත්:**
**පෝලාරිස් ව්‍යාපෘතිය:**
www.polarisproject.org

**හදිසි අවස්ථාවක දී, වහාම 911 අමතන්න.**

WE ARE YOUR DOL

NEW YORK STATE | Department of Labor

@nyslabor | www.labor.ny.gov
1-888-469-7365

නිව්යෝර්ක් රාජ්‍ය කම්කරු දෙපාර්තමේන්තුව යනු සම අවස්ථා ලබාදෙන සේවාදායකයෙකු/වැඩසටහනක් වේ. ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඉල්ලීම පරිදි අතිරේක උපකාර සහ සේවා නොමිලේ ලබා ගත හැකි ය TTY/TDD 711 හෝ 1-800-662-1220 (ඉංග්‍රීසි) / 1-877-662-4886.

P744 SA (02/24)







# බලහත්කාරයෙන් වැඩ ගැනීම අපරාධයකි

## මිනිස් ජාවාරමේ වින්දිතයින් සඳහා උපකාර

WE ARE YOUR DOL

NEW YORK STATE | Department of Labor

## බලහත්කාරයෙන් වැඩ ගැනීම යනු කුමක්ද?

“මිනිස් ජාවාරම” ලෙසද හැඳින්වෙන බලහත්කාරයෙන් වැඩ ගැනීම බරපතල අපරාධයකි. තමන්ට සිදුවන දේ නීති විරෝධී බවත්, උපකාර ලබා ගත හැකි බවත් ජාවාරමට ලක් වූ පුද්ගලයින් නොදැන සිටිය හැකිය. **පුද්ගලයෙකු කැමැත්තෙන් තොරව වැඩ කිරීමට තවත් අයෙකු පොළඹවා ගැනීම සඳහා බලය, වංචාව හෝ බලකිරීම භාවිතා කරන විට ශ්‍රම ජාවාරම සිදු වේ.**

**බලය:** සේවකයෙකු හෝ ඔහුගේ පවුලේ අයට සත්‍ය ලෙසම ශාරීරික ප්‍රචණ්ඩත්වය යෙදවීම හෝ ඒ සඳහා තර්ජනය කිරීම.

**වංචාව:** ග්‍රීන් කාඩ්පතක් හෝ මුදල් පොරොන්දු වීම වැනි ජාවාරම්කරුට ඉටු කිරීමට අදහසක් නොමැති ව්‍යාජ පොරොන්දුවක් ලබාදීම.

**බලහත්කාරය:** ආගමන විගමන හෝ පොලීසිය ඇමතීමට තර්ජනයකිරීම සහ අපරාධයක් ගැන බොරු චෝදනා කිරීම හෝ ණයක් ගෙවීම සඳහා වැඩ කළ යුතු බවට ව්‍යාජ ප්‍රකාශ සිදු කිරීම යනාදී ලෙස පුද්ගලයෙකුට වැඩ කිරීමට බල කිරීම සඳහා කරනු ලබන තර්ජනයකි.

වින්දිතයින් පාලනය කිරීම සඳහා ජාවාරම්කරුවන් පහත ආකාරයෙන්**බිය, බිය ගැන්වීම, අපයෝජනය සහ මානසික උපක්‍රම** මුසුවක් භාවිතා කරයි:

**චිත්තවේගීය අපයෝජනය:** සේවකයා අන් අය ඉදිරියේ අවමානයට ලක් කිරීම, විකට නම්වලින් ඇමතීම, වින්දිතයාට වරදකාරි හැඟීමක් ඇති කිරීම සහ තත්වය සම්බන්ධයෙන් ඔවුන්ට දොස් පැවරීම. ජාවාරම්කරුවන් ඔවුන්ගේ උසස් බව හැඟවීමට ස්ත්‍රී පුරුෂ භාවය, වයස හෝ ජාතිකත්වය මත පදනම්ව තම වරප්‍රසාද තහවුරු කළ හැකිය. අනෙක් අතට, ජාවාරම්කරුවන් තමන් වෙත කෘතඥතාව ලබාගැනීම සඳහා සේවකයාට ප්‍රශංසා කළ හැකිය, තමන් ඔවුන් මත විශ්වාසය තබන බව පැවසිය හැකිය, නැතහොත් ඔවුන් රැකබලා ගන්නා එකම තැනැත්තා හෝ ඔවුන්ට රැකියාවක් ලබා දෙන්නේ තමන් පමණක් බව සේවකයාට පැවසිය හැකිය.

**හුදකලා කිරීම සහ පාලනය:** ජාවාරම්කරුවා සේවකයා බියගැන්වීම සඳහා, කිසිවෙකුට කථා නොකළ යුතු බව සේවකයාට පැවසීම, දුරකථනය හෝ කැමරාව මගින් නිරන්තරව සේවකයා අධීක්ෂණය කිරීමට හෝ ආයුධ ප්‍රදර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කිරීම යනාදිය සිදු කළ හැකිය. යැපුම්කාරී තත්වයක් නිර්මාණය කිරීම සඳහා ජාවාරම්කරුවා වරින් වර, ඉතා සුළු වශයෙන් ගෙවීම් කර හෝ කිසිසේත් නොගෙවා සේවකයාට මුදල් සඳහා ප්‍රවේශය සීමා කළ හැකිය.

## විභව්‍ය ජාවාරම හඳුනා ගැනීම

මිනිස් ජාවාරම, පහත සඳහන් ඒවා ඇතුළු බොහෝ කර්මාන්තවල සිදුවිය හැකිය:

- ඇඟලුම් කර්මාන්තශාලා වැනි කර්මාන්තශාලා
- ගොවිපලවල් හෝ භූමි අලංකරණය
- ඉදිකිරීම්
- පුද්ගලික නිවාස (උ.දා., දරුවන් බලා ගන්නා අය සහ ගෘහ පාලිකාවන්)
- අවන්හල්, බාර්, හෝටල් හෝ වෙනත් සේවා කර්මාන්ත
- නිරුවත් වීමේ සමාජශාලා, වීදි ගණිකා වෘත්තිය, ව්‍යාජ සම්බාහන මධ්‍යස්ථාන, ආරක්ෂක සේවා, ගණිකා නිවාස ආදිය.

පහත සඳහන් තත්වයක පසුවන්නේ නම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ගොදුරු විය හැකිය:

- නිදහසේ පැමිණ යා නොහැක
- ඔවුන්ගේම හඳුනාගැනීමේ ලේඛන හෝ මුදල් පාලනය කළ නොහැක
- ගෙවීමක් නොලැබේ නැතහොත් ගෙවනු ලබන්නේ ඉතා අල්ප වශයෙනි
- අසාමාන්‍ය ලෙස දිගු පැය ගණනක් වැඩ කරයි
- විශාල හෝ වැඩි වන ණය ප්‍රමාණයක් තිබේ
- අසාමාන්‍ය ලෙස ඉහළ ආරක්ෂාවක් හෝ බොහෝ කැමරා සහිත ස්ථානයක ජීවත් වේ
- අසාමාන්‍ය ලෙස කනස්සල්ල, බිය, යටහත් පහත් බව, මානසික අවපීඩනය, නොසන්සුන්තාව පවතී
- පැහැදිලි කළ නොහැකි තුවාල හෝ දීර්ඝ කලක් පවතින හෝ ප්‍රතිකාර නොකළ රෝග හෝ රෝග ලක්ෂණ තිබේ
- ශාරීරික හෝ ලිංගික අපයෝජනය, ශාරීරික සංයමය, සිරගත කිරීම හෝ වධහිංසා පැමිණවීමේ සලකුණු පෙන්වයි

## මිනිස් ජාවාරමට ගොදුරු වූවන්ට උපකාර කිරීමේදී නිව්යෝර්ක් ප්‍රාන්තයේ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

අවම වැටුප්, අතිකාල, නොගෙවූ වැටුප් සහ නීති විරෝධී අඩු කිරීම් වැනි නිව්යෝර්ක් කම්කරු නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ පැමිණිලි ලබා ගැනීමට සහ විමර්ශන පැවැත්වීමට කම්කරු දෙපාර්තමේන්තුවට බලය ඇත. ව්‍යාපාරවලට ඇතුළුවීමට හා පරීක්ෂා කිරීමට, සේවකයින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමට සහ වැටුප් ලේඛන සමාලෝචනය කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවේ විමර්ශකයින්ට බලය ඇත. සිදුවිය හැකි ජාවාරම් හඳුනා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුහුණු කරනු ලැබේ. සංක්‍රමණික ප්‍රතිපත්ති හා කටයුතු අංශය, පහත දේද ඇතුළුවා කම්කරු දෙපාර්තමේන්තුවේ මානව ජාවාරම් විරෝධී උත්සාහයන් සම්බන්ධීකරණය කරයි:

- මිනිස් ජාවාරම් වැඩසටහන NY ප්‍රතිචාරයට යොමු කිරීම
- මිනිස් ජාවාරම ඇතුළු බරපතල සුදුසුකම් ලැබිය හැකි අපරාධවලට ගොදුරු වූවන් සඳහා යූ හෝ ටී වීසා සඳහා සහතික ලබා දීම
- ප්‍රජාව සහ ව්‍යාපාර එළඹුම් ඉදිරිපත් කිරීම හරහා මහජනතාවගේ දැනුවත්භාවය වැඩි කරනු ලබයි

ඔබ අපගේ සේවාවලින් කිසිවක් ගැන උනන්දුවක් දක්වන්නේ නම්, කරුණාකර **877-466-9757** හෝ විද්‍යුත් තැපැල **trafficking@labor.ny.gov** මගින් අනුකූලතා සහ අධ්‍යයන අංශය (මින් පෙර සංක්‍රමණික ප්‍රතිපත්ති හා කටයුතු අංශය යනුවෙන් හැඳින්වූ) අමතන්න.

